# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ කාර්මික ශිල්පී - (HVAC)

**කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලය සඳහා සුදුසුකම් ලත් තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ (HVAC) කාර්මික ශිල්පී තනතුරට අයදුම්කරුවන් / කාරිණියන් බඳවා ගනු ලැබේ.**

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ඔබගේ මානුෂීයභාවයත්, කරුණාවන්ත බවත් ඉතාමත් වැදගත් වේ. ඔබගේ ලිංගික, ආගමික හා දේශපාලනික අභිමතයන් පිළිබඳ නොව, ශ්‍රී ලංකාවේ සිටින අන් කිසිවෙකුටත් වඩා උසස් අන්දමින් රැකියාව කිරීමට ඔබට ඇති හැකියාව පිළිබඳ පමණක් අප සැලකිලිමත් වේ.**

තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ (HVAC) කාර්මික ශිල්පියා විසින් තානාපති කාර්යාලයේ ගොඩනැගිලි තුළ තිබෙන පද්ධති වල නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු වේ. තනතුර සඳහා සුදුසුකම් ලබන්නා විසින් ටොන් 100 හෝ ඊට විශාල ශීතකරණ යන්ත්‍ර සහ විශාල වාතාශ්‍ර-හැසිරුම් ඒකක ඇතුළු වාණිජ හා කර්මාන්ත මට්ටමේ HVAC පද්ධති සවි කිරීම, ක්‍රියා කරවීම, නඩත්තුව සහ අලුත්වැඩියාව සිදු කිරීමේ හැකියාව තිබිය යුතු ය. තෝරාගන්නා ලද අයදුම්කරුවා / කාරිණිය හට පද්ධති පිළිබඳ පුළුල් දැනුමත්, විශිෂ්ඨ කුසලතාවත්, මනා අවබෝධයත් තිබිය යුතු අතර ස්ටාටර් මෝටර, උෂ්ණත්ව පාලක, ආර්ද්‍රතා පාලක, විචල්‍ය සංඛ්‍යාත ධාවක (VDF) මෝටර සහ පාලක, සංවේදක ඇතුළු HVAC පාලක පිළිබඳ ඉතා පුළුල් දැනුමක් තිබිය යුතු ය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප US $464 /-**
කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2022 මැයි 31 වනදා වන විට විනිමය අනුපාතය ඇ.ඩො.1 = රු. 355 කි.
මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

1. **අධ්‍යාපනය -**
   ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීම *(අ.පො.ස. සාමාන්‍ය පෙළ සම්පූර්ණ කර තිබීම - ගණිතය ඇතුළු විෂයයන් 6ක් සමත්ව තිබිය යුතු අතර ඉන් අවම වශයෙන් විෂයයන් 3ක් සඳහා විශිෂ්ට හෝ සම්මාන සාමාර්ථ තිබීම)* අත්‍යවශ්‍ය වේ.

   පිළිගත් අධ්‍යාපන ආයතනයකින් කාර්මික ශිල්පීන් සඳහා විශේෂ වූ පුහුණු ශිල්පීය වෘත්තීය පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබිය යුතු ය. අදාළ පාඨමාලාව පැනැත්තා විසින් HVAC හි මූලධර්ම, පද්ධති සැලසුම් කිරීම, නඩත්තුව සහ දෝෂ පිළිසකර කිරීමත්, විවිධ ෆ්‍රියෝන් වර්ග සහ එහි භාවිතයත්, පීඩන ගොඩනැගීමත්, ගෘහස්ථ වායු ගුණාත්මකභාවයත් මෙන්ම අනෙකුත් විශේෂ යෙදුම් පිළිබඳව හදාරා තිබිය යුතු ය. **(අදාළ අධ්‍යාපන සහතික පත්‍ර මේ සමග අමුණා එවිය යුතුය.)**

2. **පූර්ව රැකියා පළපුරුද්ද -** ටොන් 100 හෝ ඊට විශාල ශීතකරණ යන්ත්‍ර සහ විශාල වාතාශ්‍ර-හැසිරුම් ඒකක ඇතුළු වාණිජ හා කර්මාන්ත මට්ටමේ HVAC පද්ධති සවි කිරීම, ක්‍රියා කරවීම, නඩත්තුව සහ අලුත්වැඩියාව සිදු කිරීම සඳහා වූ පුහුණු ශිල්පී මට්ටමේ අවම වශයෙන් වසර තුනක රැකියා පළපුරුද්ද තිබිය යුතු ය. මෙහෙයුම්, නඩත්තු සහ දෝෂ පිළිසකර කිරීම ඇතුළුව සංකීර්ණ, නවීන උපකරණ සහ කොටස් භාවිතය පිළිබඳ වගකීම් වැඩි වන ලෙස ප්‍රගතියක් පෙන්වන ආකාරයේ රැකියා පළපුරුද්දක් තිබිය යුතු ය. **(අදාළ සේවා සහතිකපත් මේ සමග අමුණා එවිය යුතුය.)**

3. **භාෂා ප්‍රවීණතාවය -** II මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි කියවීම, ලිවීම, කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. (**මෙය පරීක්ෂා කරනු ලැබේ**).
   III මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

**අයදුම් කරන ආකාරය:**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අවශ්‍ය ලේඛන:**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය**. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- අදාළ රියදුරු බලපත්‍රය
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**තැපැල් හෝ ඊමේල් මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2022 **ජූලි** 01 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.